අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය 'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
கல்வி, உயர் கல்வி மற்றும் தொழிற் கல்வி அமைச்சு 'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
**Ministry of Education, Higher Education and Vocational Education** 'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

## උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව
## (දහතුන් වසරක සහතික කරන ලද අධ්‍යාපන වැඩසටහන)
## 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026/2027

උසස් පෙළ වෘත්තීය විෂය ධාරාව යටතේ 2026/2027 අධ්‍යයන වර්ෂය සඳහා 12 ශ්‍රේණියට සිසුන් ඇතුළත් කරගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව **වෘත්තීය විෂය ධාරාව ක්‍රියාත්මක කෙරෙන පාසල්වලට** (අදාළ පාසල් ලේඛන මෙතැනින් ලබා ගන්න) **ඇතුළත් වීම සඳහා සිසුන්ට අයදුම්පත් යොමු** කළ හැකි අතර මෙම විෂය ධාරාවට සිසුන් ඇතුළත්කර ගැනීමේ දී **අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයේ ප්‍රතිඵල සලකා බලනු නොලැබේ.**

වෘත්තීය විෂය ධාරාව යටතේ, **12 ශ්‍රේණියේ පාසල් අධ්‍යයන කටයුතු සම්පූර්ණ කර, 13 ශ්‍රේණියේ** පහත දක්වා ඇති වෘත්තීය විෂයයන්ගෙන් එකක් යටතේ ඇති **NVQ (ජාතික වෘත්තීය සුදුසුකම්) 4වන මට්ටමේ වෘත්තීය පුහුණු පාඨමාලාවක් සම්පූර්ණ කිරීමට** සිසුන්ට හැකියාව ලැබෙනු ඇත.

1. ළමා මනෝ විද්‍යාව හා ආරක්ෂණය
2. සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණය
3. ශාරීරික අධ්‍යාපනය හා ක්‍රීඩා
4. ප්‍රාසාංගික කලාව
5. කාර්ය සිද්ධි කළමනාකරණය
6. ශිල්ප කලා
7. අභ්‍යන්තර නිර්මාණකරණය
8. විලාසිතා නිර්මාණකරණය
9. ග්‍රැෆික් නිර්මාණකරණය
10. සංචාරණය හා ආගන්තුක සත්කාර
11. භූ දර්ශන නිර්මාණකරණය
12. ව්‍යවහාරික උද්‍යාන විද්‍යා තාක්ෂණ අධ්‍යයනය
13. පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
14. ආහාර නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
15. ජලජ සම්පත් තාක්ෂණ අධ්‍යයනය
16. වැවිලි බෝග නිෂ්පාදන තාක්ෂණ අධ්‍යයනය
17. ඉදිකිරීම් තාක්ෂණ අධ්‍යයනය
18. මෝටර් යාන්ත්‍රික තාක්ෂණ අධ්‍යයනය
19. විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්ෂණ අධ්‍යයනය
20. ජේෂකර්ම හා ඇඟලුම් තාක්ෂණ අධ්‍යයනය
21. ලෝහ සැකසුම් තාක්ෂණ අධ්‍යයනය
22. ඇලුමිනියම් පිරිසැකසුම් තාක්ෂණ අධ්‍යයනය
23. කලාව හා පිරිසැකසුම්කරණය
24. පාරිසරික අධ්‍යයනය
25. පරිගණක දෘඩාංග සහ ජාලකරණය
26. නිමැවුම්කරණය
27. විකුණුම් හා අලෙවිකරණය
28. සැපයුම් කළමනාකරණය

**ඒ අනුව මේ සමග ඇති** අයදුම්පතේ ආකෘතියට **අනුව සකස් කරන ලද අයදුම්පතක් ඔබ ඇතුළත්වීමට අපේක්ෂිත පාසලේ විදුහල්පති වෙත යොමු කළ යුතු ය. එම අයදුම්පත පහත වෙබ් අඩවියෙන් බාගත කළ හැකි ය.**

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු මෙම අමාත්‍යාංශයේ සැමට අධ්‍යාපන ශාඛාව හා සම්බන්ධ වීමෙන් හෝ මෙම අමාත්‍යාංශයේ වෙබ් අඩවිය හරහා ලබාගත හැකි ය.

අධ්‍යාපන අධ්‍යක්ෂ (සැමට අධ්‍යාපන)
අධ්‍යාපන, උසස් අධ්‍යාපන හා වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය, බත්තරමුල්ල
0112 787136, 0112 786746, directorefa@moe.gov.lk
Web – www.moe.gov.lk
Facebook – A/L Vocational Stream (www.facebook.com/vocationalStream)